**සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය - 2021**
-----------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් කර දැක්විය නොහැකි වුවද සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවති රු.69,119,727 ක බැංකු අයිරාව රු.29,160,605 ක්වූ බැංකු ශේෂයන්ට හිලව් කර දක්වා තිබුණි. | ඉදිරියේදී එය වෙන් වශයෙන් ජංගම වගකීම් හා ජංගම වත්කම් යටතේ දැක්වීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශණයේ මූල්‍ය වත්කම් වර්ගීකරණය 2018 වර්ෂයේ බලාත්මක වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 අනුව (SLFRS 09) සිදු කල යුතු වුවද මාධ්‍ය ජාලය විසින් මූල්‍ය වත්කම් වර්ගීකරණය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 (LKAS 39) අනුව සිදු කර තිබුණි. | ආයතනයේ මූල්‍ය වත්කම් හඳුනාගත් විට එය වත්කම් කළමනාකරණය සඳහා වන ආයතනයේ ව්‍යාපාර ආකෘතිය සහ මුදල් ප්‍රවාහ පදනම් කර ගෙන දක්වා ඇත .වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ දැක්වීමේදී අවශ්‍ය ප්‍රතිපාදන (Provisions) සිදු කර මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට වර්ගීකරණය කිරීම් සිදු කර ඇත .වෙන් වෙන් වශයෙන් අවධානම හඳුනා ගෙන ප්‍රතිපාදන සිදු කර මූල්‍ය වත්කමද මූල්‍ය වගකීම් ද හඳුනාගෙන ආයතනය අලාභය හරහා සාධාරණ වටිනාකමකින් දක්වා ඇත. | ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 හි 18 බී ඡේදය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමයට පිළියෙළ කිරීමේ දී මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහය ගණනය කිරීම සඳහා බදු පෙර ලාභය යොදාගත යුතු වුවත් මාධ්‍ය ජාලය විසින් විස්තීර්ණ ආදායම් ගැලපීමෙන් පසු අලාභය රු.329,653,045 යොදා ගෙන තිබුණි. ඒ අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහය රු. 14,058.366 ක් අඩුවෙන් දක්වා තිබුණි | IFRSවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ අනෙකුත් විස්තීර්ණ ආදායම වෙනම දක්වා ඇතත් ආයතනයේ මෙහෙයුම් ලාභ අලාභ ගණනය කිරීමේදී විස්තීර්ණ ආදායම ගැලපිය යුතුව ඇත | ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 (LKAS 24) අනුව මූල්‍ය ප්‍රකාශන වල සම්බන්ධිත පාර්ශවයන් සම්බන්ධව හෙළිදරව් කිරීම් කල යුතු වුවද මාධ්‍ය ජාලය විසින් ප්‍රධාන කළමනාකාරීත්වයේ පුද්ගලයන් සම්බන්ධයෙන් අදාල තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | කළමනාකාරීත්වයේ පුද්ගලයන් සම්බන්ධයෙන් (Key Management Personal – KMPs) විස්තර දැක්වීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 15 අනුව(SLFRS 15) ගණුදෙනුකරුවන් සමඟ ඇති වූ ගිවිසුම් වලින් පැන නැඟී ඇති ණය ගැතියන් හා ණය හිමියන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගිවිසුම් වත්කම් හා ගිවිසුම් වගකීම් ලෙස වෙන වෙනම දැක්විය යුතු වුවද ප්‍රතිවෙළඳ ගිවිසුම් මගින් ඇති වූ ණයගැති ශේෂ හා ණයහිමි ශේෂය පිළිවෙලින් රු.28,824,028 ක් හා රු. 69,702,230 ක් වෙළඳ හා ලැබිය යුතු වෙනත් දැ යටතේ හා විලම්භිත ආදායම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | ඉදිරියේදී ද වෙන් වශයෙන් දැක්වීමට කටයුතු කරනු ඇත . | ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.2 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාධ්‍ය ජාලයේ ස්කන්ධ ප්‍රාග්ධනය 2015 වර්ෂයේ රු. 3,198,499,721 ක් වූ අතර 2021 වර්ෂය දක්වා අඛණ්ඩව අඩු වී තිබුණි. 2016 වර්ෂයේ සමාගමේ අලාභය රු.107,189,266 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ ස්වාධීන රූපවාහිනියේ අලාභය රු.238,131,346 ක්ද අයිටීඑන් එෆ්එම් හි අලාභය රු.41,325,521ක්ද වසන්තම් එෆ්එම් හි අලාභය රු.10,455,852 ක් හා වසන්තම් රූපවාහිනීයට රු.46,337,505 ක ප්‍රදාන ලැබීමෙන් පසුද අලාභය රු.26,061,682 ක් ද වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සමාගමේ මුළු අලාභය රු.315,974,401 ක් වී තිබුණි. | අදහස් දක්වා නොමැත. | දිගින් දිගටම සිදුවන අලාභ අඩුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසානයට මාධ්‍ය ජාලයේ වර්ෂය ඉක්ම වූ ණයගැති ශේෂයරු.371,580,502 ක් වී තිබුණු අතර එයින් රු.2,531,970 ක් සඳහා පමණක් නීතිමය ක්‍රියා මාර්ග ගෙන තිබුණි. | වසරකට වැඩි ශේෂවලින් යම් මුදල් ප්‍රමාණයක් මේ වන විටත් ලැබෙමින් පවතින අතර ලබා ගත හැකි සෑම මුදලක්ම ලබා ගැනීමට කටයුතු කරමින් සිටී ඉහත ශේෂයන්ගෙන් රු.මි . 6.5සඳහා නීතිමය කටයුතු අවසන් කර ඇත . තවත් රු.මි 26 .ක් සඳහා ක්‍රියා මාර්ග ගැනීමට නීති අංශයට යොමු කර ඇතත් යම් නීති ගැටළු මත ඒවා නිරාකරණය කර ගනිමින් අදාල කටයුතු කරමින් සිටියි .එමෙන්ම නීති කටයුතු සඳහා ඉතා විශාල කාලයක් ගත වන බැවින් සෑම විටම සාකච්ජා කර කොටස් වශයෙන් හෝ මුදල් ලබා ගැනීමට කටයුතු කරමි.ලිපි ලේඛන නිසි පරිදි සම්පුර්ණ වී ඇති ප්‍රධාන ගනුදෙනුකරුවන් නොවන අය සඳහා නීති කටයුතු කරන අතර ප්‍රධාන ඒජන්සි වලින් ලැබිය යුතු ශේෂයන් සඳහා නීති කටයුතු කිරීමට අපහසු වී ඇත්තේ ඔවුන් විසින් නිරන්තරයෙන් ආයතනය වෙත දැන්වීම් ලබා දෙමින් සිටින බැවින්ය .මෙම ව්‍යාපාරය ප්‍රධාන ඒජන්සි කිහිපයක් හා සීමිත ගනුදෙනු කරුවන් ප්‍රමාණයක් මත රඳා පවතින බැවින් මෙම තත්වය ඇති වී ඇත. | ණයගැති ශේෂය අය කර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. ලිපි ලේඛන කටයුතු විධිමත්ව පවත්වා ගතයුතු අතර අයවිය යුතු ශේෂ අයකර ගැනීම සඳහා නොපමාව කටයුතු කළ යුතුය. |
| (ආ)සමාලෝචිත වර්ෂය අවසානයට සේවාදායක ප්‍රතිවෙළඳ ණයගැති ශේෂය රු. 28,824,029 ක් වූ අතර මාධ්‍ය ජාලය විසින් අදාළ සේවාවන් සපයා නොගැනීම හේතුවෙන් වසර 05 ක් ඉක්මවා ඇති ප්‍රතිවෙළඳ ණයගැති ශේෂයන්ගේ එකතු රු. 14,641,728 ක් සඳහා මුල්‍ය වර්ෂයේ හානිකරණ ගැලපීම සිදුකර තිබුණි. | මෙම ප්‍රතිවෙළඳ ණයගැති ශේෂය සඳහා වසර 05 ක් ඉක්මවා ඇති බැවින් ගිණුම්කරණ වලට අනුව හානිකරණ ගැලපීම සිදු කරන ලදී. | ප්‍රතිවෙළඳ ගිණුම්වලට අදාල සේවා ලබා ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 69,702,230ක් වූ විලම්බිත ආදායම් ශේෂය තුළ වසර 05 ට අඩු ශේෂය රු.22,725,000 ක් ද, වසර 05 ත් 10 ත් අතර ශේෂය රු. 45,379,753 ක් ද, වසර 10 ට වැඩි ශේෂය රු. 1,597,477 ක් ද ඇතුළත්ව තිබුණු අතර එම ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | මෙහි වසර 03 ඉක්මවා ඇති ශේෂයන් 2021 වර්ෂයේදී මෙන් විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ගිණුම් වලින් ඉවත් කර නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | විලම්භිත ආදායම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ)සමාලෝචිත වර්ෂය අවසානයට රු.127,240,756 ක්වූ සේවාදායක අත්තිකාරම් ශේෂය තුළ ඇතුළත් වසර 10ක් ඉක්මවූ රු.41,470,241 ක ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි | මෙහි ශේෂයේ කිහිපයක් නිවැරදිව හඳුනා ගෙන 2021 වර්ෂයේදී ගැලපීම සිදු කරන ලද අතර එලෙසම මෙම වර්ෂයේදී එම ශේෂයන් හඳුනා ගෙන ගැලපීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත. | සේවාදායක අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීම සඳහා අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (ඇ)මූල්‍ය ප්‍රකාශන අනුව රු. 5,718,320 ක් වූ අවලංගු කළ චෙක්පත් ගිණුමේ ශේෂය තුළ වසර 03 කට වඩා වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන රු.2,644,085 ක් වටිනා චෙක්පත් 242ක්සහ වසර 02 ත් 03 ත් අතර කාලයට අදාල රු.2,485,466 ක් වටිනා චෙක්පත් 239ක් සම්බන්ධයෙන් අවශ්‍ය ගැලපීම් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල අවලංගු කල චෙක්පත් ගිණුමේ පැවති 2017.12.31 දිනට පෙර අවලංගු කරන ලද චෙක්පත් වල වටිනාකම වන රු. 5,485,708/12 ක් විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කරන ලදී. තවදුරටත් අවලංගු චෙක්පත් ගිණුමේ පවතින ශේෂයෙන් වර්ෂ 3 ට වැඩි අවලංගු චෙක්පත් 2022 වර්ෂයේ ගිණුම් වලන් ගැලපීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | අවලංගු කල චෙක්පත් ගිණුමේ ශේෂයේ හඳුනා ගෙන නිරවුල් කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 01/2015 චක්‍රලේඛයේ | | | |
| (i) 3.1 ඡේදය | සමාලෝචිත වර්ෂය තුළදී මාධ්‍ය ජාලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම්) හා නියෝජ්‍ය | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | (ප්‍රවෘත්ති) හා (අලෙවි) විසින් පිළිවෙලින් රු. 348,708 ක් වටිනා ඉන්ධන ලීටර් 2,505 ක් රු. 167,292 ක් වටිනා ඉන්ධන ලීටර් 1,207 ක් අනුමත සීමාව ඉක්මවා ලබාගෙන තිබුණි. | සාමාන්‍යාධිකාරි (අලෙවි) ගේ රාජකාරි ස්වභාවය අනුව සීමාව ඉක්මවා ඉන්ධනලබාගැනීමට හේතුවී ඇත.ඒ වෙනුවෙන් 2015මැයි 25දිනැති PED 2015/01චක්‍රලේඛය අනුව ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සභාපතිතුමාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. | |
| (ආ) | 2020 ජනවාරි 27 දිනැති අංක PED 1/2020 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 1.2 ඡේදය අනුව | (i) සභාපතිවරයාගේ රාජකාරි හෝ පුද්ගලික පාවිච්චිය සඳහා සපයා තිබූ නිල වාහනයට අමතරව කුලී වාහනයක් යොදවා සමාලෝචිත වර්ෂයේ දී එම වාහනය සඳහා රු. 1,088,897 ක් වටිනා ඉන්ධන ලීටර් 6,347 ක් සපයා තිබුණු අතර කුලිය වශයෙන් රු.3,438,685ක් ගෙවා තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| | | (ii) චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සභාපති තනතුරට අනුමත ඉන්ධන ප්‍රමාණය ලීටර් 1,800ක් වුවත් අනුමත ප්‍රමාණය ඉක්මවා රු.1,035,828 ක් වටිනා ඉන්ධන ලීටර් 6,025 ක් සපයා තිබුණි. | සභාපතිතුමාගේ රාජකාරි ස්වභාවය මත ඉන්ධන සීමාව වැඩිවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 33/334 යටතේ සමාගමක් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල බලතල මත 2020 ජනවාරි සිට සභාපතිවරයාගේ අමතර ඉන්ධන වැයවීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2021 දෙසැම්බර් 15 දිනැති අංක පීඊඩී 03/2021 චක්‍රලේඛය | 2020 මුල්‍ය වර්ෂයේ දී අලාභ තත්වයක් වාර්තා කර ඇති, එහෙත් 2021 මුල්‍ය වර්ෂයට සාපේක්ෂව එම අලාභදායී බව අඩු කරගෙන නොමැති රජය සතු සමාගම් එක් අයෙකුට රු. 3,000 ක් පමණක් ප්‍රසාද දීමනා ගෙවිය යුතු වුවත් එයට පටහැනිව මාධ්‍ය ජාලය විසින් එක් අයෙකුට රු.3,000 ඉක්මවා රු. 13,027,000 ක් ප්‍රසාද දීමනා අනුමැතියෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | චක්‍රලේඛයට අනුව රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් වල කාර්යමණ්ඩලයට ප්‍රසාද දීමනා අංක 03 යටතේ රු 5000 . බැගින් ගෙවිය හැක . අදාළ මුදල් වර්ෂය තුල අලාභ තත්වයක් පසුගිය වර්ෂයට සාපේක්ෂව අඩු කර ගෙන ඇති අයතන වලට 3වෙනි පදනම යටතේ රු 5000. ගෙවිය හැකි බැවින් රු 5000 ප්‍රසාද දීමනා ගෙවා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**1.8 මුදල් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ස්ථාවර තැන්පතුවක් ඇපයට තබා රු.මිලියන 75ක අයිරා සීමාවක් අනුමත කර ගෙන තිබුණු අතර වර්ෂය අවසාන අයිරා ශේෂය රු.69,119,727 ක් විය.එසේ වුවද සමාලෝචිත වර්ෂයේ මාස 07 ක් අඛණ්ඩව අනුමත අයිරා සීමාව ඉක්මවා අයිරා පොලී ලෙස රු. 3,593,733 ක් ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | අයිරා පහසුකම් ලබා ගැනීම විධිමත් අනුමැතිය මත සිදු කළ යුතු අතර වියදම් කළමනාකරණය කළ යුතුයි. |
| (ආ) | මාධ්‍ය ජාලයේ කාරක ප්‍රාග්ධනය 2020 වර්ෂයේ රු. 620,761,280 ක් වූ අතර 2021 වර්ෂයේ දී එය රු.399,833,265 ක් දක්වා අඩු වී තිබුණි. ඒ අනුව කාරක ප්‍රාග්ධන කළමනාකරණයේ පවතින දුර්වලතා හේතුවෙන් එදිනෙදා මුල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමේ දුෂ්කරතාවයට මුහුණ දී තිබුණි.ප්‍රායෝගිකව කාරක ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේ දී කාර්තුමය වශයෙන් මුදල් ලැබීම් හා ගෙවීම් පුරෝකථනය කරමින් සමාලෝචිත වර්ෂය සඳහා මුදල් අයවැයක් පිළියෙල කර මුදල් ප්‍රවාහ සැලසුම් කළ යුතු වුවද එවැනි අයවැය පාලන ක්‍රම භාවිතා කර නොතිබුණි. | සාමාන්‍ය වෙළඳපොළ තත්වයක් අපේක්ෂාවෙන් ආදායම පුරෝකථනය කලද පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් විශාල වෙළඳපොළ විචලාතාන්ට ලක් වීම නිසා 2021 අපේක්ෂිත ආදායම් තත්වය කරා ළඟාවිය නොහැකි වුවත් ස්ථාවර තැන්පතු යොදා නොගෙන ආයතනයේ මුල්‍ය කටයුතු සිදු කිරීමට හැකි විය. එම නිසා ප්‍රායෝගිකව මුදල් අයවැයක් පිළියෙල කිරීමේ ගැටළුකාරී තත්වයකට මුහුණ දෙන ලදී. මෙම වසරේදී ද පවතින අර්බුදකාරී තත්වය මත ප්‍රායෝගිකව පුරෝකතනය කිරීම වුවද අයවැය පාලන ක්‍රමයක අවශ්‍යතාවය පැන නැගී ඇත. | ප්‍රාග්ධන කළමනාකරණයේ පවතින දූර්වලතා මග හරවා ගැනීමට කටයුතු කළ යුතු අතර නිසි අයවැය පාලන ක්‍රම භාවිතා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.330,032,837 අලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අලාභය රු. 213,974,507 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 116,058,330 ක පිරිහීමට වියදම් වැඩිවීම හා ආදායම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය සහ ක්ෂනික අනුපාතය පිළිවෙලින් 1.44 සහ 1.43 ක් විය. සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය ප්‍රතිශතයක් ලෙස සියයට -23 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව ප්‍රතිශතයක් ලෙස සියයට 5 කින් ඉහළ යාමකි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව විකුණුම් ආදායමට ශුද්ධ කාරක ප්‍රාග්ධන අනුපාතය 1.67 කින්ද මෙහෙයුම් වියදම් ප්‍රතිශතය සියයට 4 න්ද පිරිහී තිබුණි. වෙළඳපොළ තරඟකාරීත්වය, අහිතකර මූලික මූල්‍ය අනුපාත, අඛණ්ඩව සැලකිය යුතු මෙහෙයුම් අලාභ ලැබීම හා ඵලදායීතාවක් නොමැති අධික සේවක සංඛ්‍යාවක් බඳවාගැනීම් මත අනාගතයේදී මාධ්‍ය ජාලයට අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අවදානම් තත්වයකට මුහුණදීමට සිදුවිය හැකිය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 වර්ෂය දී මාධ්‍ය ජාලය විසින් මිලදී ගෙන ඇති දේශීය ටෙලි නාට්‍ය 8 ක් තුලින් රු.18,348,836 ක අලාභයක් ලබා තිබුණු අතර මින් පූර්ව දර්ශන මණ්ඩලය මගින් විකාශනයට නුසුදුසු බවට නිර්දේශ කරන ලද "සත් වර්ෂා" ටෙලි නාට්‍යය නිෂ්පාදිකාවගේ අභියාචනාවක් මත නැවත පත්කරන ලද සමීක්ෂණ මණ්ඩලයක අනුමැතියෙන් පූර්ව දර්ශනය කොට විකාශනය කර තිබූ අතර එමගින් මාධ්‍ය ජාලයට රු. 5,100,506 ක අලාභයක් දැරීමට සිදු වී තිබුණි. | "සත් වර්ෂා" නාට්‍ය පූර්ණ සංස්කරණයට ලක් කොට නැවත අභියාචනා මණ්ඩලයට යොමු කර ඇත. මෙම නාට්‍ය අභියාචනා මණ්ඩලය විසින් ප්‍රේක්ෂක අවධානයට ලක්විය හැකි ආදර්ශමත් නාට්‍යයක් ලෙස නිර්දේශ කර තිබුණි. ඒ අනුව සාමාන්‍යයෙන් නාට්‍ය කථාංගයකට ගෙවන ගාස්තුවට වඩා අඩුවෙන් එනම් එක් කථාංගයක් රු.150,000/- බැගින් මිලදීගෙන මෙම නාට්‍ය විකාශය කරන ලදී. නමුත් සවස 06 ගුවන් කාලයේ දැන්වීම් ආදායම අඩු බැවින් මෙම නාට්‍යයෙන් පාඩු ලබා ඇත. | ටෙලි නාට්‍ය තුලින් ඉපයිය හැකි ලාභ උපරිමවන අන්දමින් කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මාධ්‍ය ජාලයට එරෙහිව අපහාස වන්දි නඩු 03 ක්ද ශ්‍රී ලංකාව තුළ මාධ්‍ය මගින් චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම, බෙදා හැරීම හෝ විකිණීමට ඇති අයිතිවාසිකම සමාගම විසින් කඩ කිරීමට එරෙහිව නඩු 06 ක්ද චිත්‍රපට බුද්ධිමය දේපල නඩු 06 ක්ද සේවයෙන් පහ කිරීම, සේවය අවසන් කිරීම සහ අනිවාර්ය විශ්‍රාම ගැන්වීම | වන්දි මුදල් අනාගතයේදී ගෙවීමට අධිකරණයේදී නියම කළහොත් එම වන්දි මුදල් සඳහා ප්‍රතිපාදන අදාළ වර්ෂයේදී සිදු කරනු ඇත. | මාධ්‍යජාලයට එරෙහිව පවරා ඇති නඩු සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් හෙළි දරව් කිරීම් කළයුතු අතර කෙටිකාලීන මූල්‍ය හැකියාව පහළ වැටීමක් සිදු නොවන පරිදි කටයුතු කළ යුතුය. |

සම්බන්ධයෙන් නඩු 05 ක්ද වෙනත් කරුණු සඳහා නඩු 04 ක්ද පවරා තිබුණු අතර එමගින් ඉල්ලුම් කරන ලද මුළු වන්දි මුදල රු. 741,650,000 ක් විය.මෙම නඩු සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 1,036,494 ක වියදමක් දරා තිබුණද නඩු 23 සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ගුවන් කාල විකුණුම් ආදායම තුළ රු.10,130,000 ක් වටිනා සේවකයින්ට ලබා දුන් තෑගි වවුචර් ඇතුළත් වීම නිසා ප්‍රතිවෙළඳ ගණුදෙනු වලින් ගුවන් කාල ආදායමක් ලැබුවද ඊට සාපේක්ෂව මුදල් ප්‍රවාහයක් මාධ්‍ය ජාලය වෙත ගලා ඒමක් සිදු නොවීම නිසා විකුණුම් ආදායම රු.257,569,354 කින් ඉහළ ගොස් තිබුණද ශුද්ධ කාරක ප්‍රාග්ධනය රු.220,928,015 කින් අඩු වී තිබුණි. ඒ අනුව විකුණුම් ආදායමට ශුද්ධ කාරක ප්‍රාග්ධන අනුපාතය ඉකුත් වර්ෂයේදී 1.85ක් වුවද සමාලෝචිත වර්ෂයේදී එය 3.52 දක්වා ඉහළ ගොස් තිබුණි. | අදහස් දක්වා නොමැත. | අනාගතයේ දී ද්‍රවශීලතා ගැටළු ඇතිවීම වළක්වා ගැනීමට හැකිවන පරිදි කටයුතු කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාධ්‍ය ජාලය විසින් 2015 වර්ෂයේ මිලදී ගත් රු.1,588,500 ක් වූ Hot Swappable Power Distribution Rack යන්ත්‍රයක් මිලදී ගත් දින සිට සහ 2010 වර්ෂයේ මිලදී ගන්නා ලද පිරිවැය රු. 1,218,274 ක් වු Aros Flexus FT- 30 ,30KVA UPS Systems වසර 03 ක පමණ කාලයක සිට භාවිතයකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි. | Hot Swappable Power Distribution Rack යන්ත්‍රයක් සවි කරනු ලැබුවද ඊට අදාළ අනෙකුත් උපකරණ රජයේ ආනයන සීමා කිරීමේ ප්‍රතිපත්තිය හා ආයතනය තුල පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් එය ක්‍රියාත්මක මටටමට පත් කිරීමට නොහැකි වී ඇත. 30 KVA UPS System අකුණු සැර මත අක්‍රිය වී ඇති අතර රක්ෂණ වන්දිය ලබා ගැනීම සඳහා අවුරුදු 1½ කට වැඩි කාලයක් ගතවෙන ලදී. ඉන්පසු ආනයන සීමා කිරීමේ හේතුවෙන් අවුරුද්දක් පමණ කාලයක් ගතවූ අතර වර්තමානයේදී ඩොලර් වල පවතින අර්බුදකාරී තත්වය හේතුවෙන් මීට අදාළ අමතර උපකරණ ලබා ගැනීමට නොහැකි තත්වයක් උද්ගතව පවතී. | සම්පත් නිසි අන්දමින් උපයෝජනය කිරීම සඳහා කටයුතු කළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ ආයතන වැඩ සැපයුම් සේවා සඳහා රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කල යුතු වුවත්, මාධ්‍ය ජාලය විසින් 2021 දෙසැම්බර් 31 දින පවත්වන ලද “ආසියානු තරු පලස”සංගීතමය වැඩසටහනට අදාලව ඉසව් කළමනාකරණ කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ඇස්තමේන්තු වටිනාකම රු.11,000,000 ක් වූ එක් සැපයුම්කරුවකු තෝරා ගෙන තිබුණු අතර එමඟින් ප්‍රසම්පාදනයේ අරමුණු ඉටු වන පරිදි අවම පිරිවැයකින් උපරිම ආර්ථික වාසි සැලසෙන පරිදි,සුදුසුකම්ලත්උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීම සඳහා සාධාරණ හා උපරිම අවස්ථා ලබා දීමට නොහැකිවන ලෙස කටයුතු කර නොතිබුණි. තවද මෙම තෝරා ගත් ආයතනයේ පැවැත්ම පිළිබඳ කිසිඳු තොරතුරක් අන්තර්ජාල පරිශීලනයේ දී අනාවරණය නොවුණි. | මේ සඳහා රු.මිලියන 30 කට ආසන්න මුදලක් උපයනු ලැබූ අතර, වියදම රු.මිලියන 15 ක් පමණ වැය වන ලදී.මෙවැනි විශේෂ වැඩසටහන් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව සිදු කරනු නොහැකි බව දන්වා සිටිමි. මෙම වැඩසටහන අප ආයතනය විසින් සංවිධානය කර ඉදිරිපත් කරන ලද වැඩසටහනක් වන අතර ඒ බව වැඩසටහනේ ඉසව් කලමනාකරණය වෙනුවෙන් ඔවුනට ගෙවීමක් සිදු කර නොමැත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මාධ්‍ය ජාලය දිගින් දිගටම අලාභ ලබන තත්වයක හා කාරක ප්‍රාග්ධන ගැටළු වලට මුහුණ දී ඇති තත්වයක් තුල කාර්ය මණ්ඩල කළමනාකරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කල යුතු වුවත් මාධ්‍ය ජාලය මූල්‍ය වර්ෂය තුල දී කොන්ත්‍රාත් පදනමින් සේවකයින් දෙදෙනෙක් ද ,දෛනික පදනමින් සේවකයින් 16 දෙනෙක් ද බඳවා ගෙන තිබුණු අතර අනුමත කාර්ය මණ්ඩල තනතුරු වල අතිරික්ත කාර්යමණ්ඩලය 67 ක් ද,අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවූ තනතුරු වල නිලධාරීන්ට පෞද්ගලික වන සේ සේවකයන් 113 ක්ද බඳවා ගෙන තිබුණි. අනුමත කාර්යමණ්ඩලයට ඇතුලත් පුරප්පාඩු වූ ස්ථිර | අවශ්‍යතාවය මත තනතුරු අනුමත කර ඇති අතර ඒ වන විට ආයතනයේ පැවති තනතුරුවල සේවය කරන නිලධාරින් ඔවුනට පුද්ගලික වන සේ එම තනතුරුවල සේවයේ යෙදවීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර ඇත. තවද නව බඳවා ගැනීම් පරිපාටි අනුව අන්තර්ග්‍රහණය කිරීමට සුදුසුකම් නොමැති සේවක පිරිස සඳහා ඔවුන්ට පෞද්ගලික වන සේ දැනට සිටින තනතුර පවත්වා ගෙන යා යුතු අතර එම තනතුර දරන්නා වෙනත් තනතුරකට උසස් කිරීමෙන් හෝ විශ්‍රාම යාමෙන් පසු එම තනතුර අහෝසි විය යුතු බවත් එම තනතුරු සඳහා නව බඳවා ගැනීම් සිදු නොකළ යුතු බවත් සේවක සංඛ්‍යාව අනුමත කල 2018.05.08 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපියේ අංක 06 යටතේ දන්වා ඇත. ඒ අනුව බඳවා ගැනීම් පරිපාටි අනුව | අනුමත කාර්යමණ්ඩලයට අනුගතව මානව සම්පත් කළමනාකරණය කළ යුතුය. සඳහා පමණක් බඳවා ගැනීම් සිදුකළ යුතුය. |

| | |
|---|---|
| තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනමින් සේවකයන් 13 දෙනෙකු සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට බඳවාගෙන තිබුණි. | අන්තර්ග්‍රහණය කිරීමට සුදුසුකම් නොමැති කාර්ය මණ්ඩලය ඔවුන් විශ්‍රාම/ඉල්ලා අස් වී යන තෙක් ඔවුනට පුද්ගලික වන සේ එම තනතුරේ තැබීමට කටයුතු කරනු ලබන අතර ඔවුන් විශ්‍රාම/ඉල්ලා අස් වී ගිය පසු එම තනතුරු අහෝසි වූවා සේ සලකා කටයුතු කරනු ලැබේ. |